රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 04/2003

මගේ අංකය : ආ/III/2/12-3
රාජ්‍ය පරිපාලන, කළමනාකරණ හා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2003 අප්‍රේල් මස 03 වැනි දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

# <u>මෝටර් රථ රියදුරන් සඳහා රාජකාරී වේලාවන්</u>

මේ සම්බන්ධයෙන් වන 1993.06.07 දිනැති අංක 12 /93 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අවලංගු කරන අතර, ඒ වෙනුවට මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

(I) මෝටර් රථ රියදුරන් දින පහේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම් දිනකට පැය නවයක් සේවය කළ යුතුය.

(II) දින හයේ සතියක් රාජකාරියේ යෙදෙන්නේ නම් දිනකට පැය හත හමාරක් සේවය කළ යුතුය.

(III) සෙනසුරාද දිනයන්හි දීද රාජකාරියෙහි යෙදීමට නියමිත රියදුරන් සඳහා එදින පැය හය හමාරක් සේවය කිරීමෙන් සතියකට නියමිත පැය ගණන වන පැය 45 ආවරණය කිරීමට ඉඩ දිය හැක.

02. මෙම විධිවිධාන සියළුම වර්ගවල රථ වාහන රියදුරන් සඳහා අදාල වේ.

03. මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිවය.

බී.ජේ. කරුණාරත්න
ආයතන අධ්‍යක්ෂ ජනරාල්